## විදේශ කටයුතු අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2010 වර්ෂය

### 1. විසර්ජන ශීර්ෂය 112 - විදේශ කටයුතු අමාත්‍යාංශය

විදේශ කටයුතු අමාත්‍යාංශයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් ප්‍රකාශ අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2011 අගෝස්තු 08 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

#### 1.2. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

#### 1.3. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණය

2010 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව විදේශ කටයුතු අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශවල තත්වය මෙහි (අ) සිට (උ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.13 දක්වා වූ ඡේදවල ඇතුලත් වෙනත් ප්‍රධාන විගණන නිරීක්ෂණ හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය වේ.

**(අ) වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම**

අමාත්‍යාංශය විසින් වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් ගිණුම් වර්ෂය ආරම්භයේ පිළියෙල කර නොතිබුණ.

(ආ) ගිණුම් ඉදිරිපත් කිරීම

(i) අමාත්‍යාංශය විසින් 2011 මාර්තු 31 දින වන විට පහත සදහන් ගිණුම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| ශීර්ෂය /විෂය අංකය | ගිණුමේ නම |
|---|---|
| 112 | විසර්ජන ගිණුම |
| 11201 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම. |

(ii) අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛණය හා ලෙජරය | 1978 දෙසැම්බර් 19 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 842 | පවත්වා නොතිබුණි |
| පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධ ස්ථාවර වත්කම් ලේඛන | 2002 නොවැම්බර් 28 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක අයි.ඒ.අයි/2002/02 | පවත්වා නොතිබුණි |

(iii) අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 03 කට 2011 සැප්තැම්බර් 30 දින වන විටද පිලිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු. 58,266,490 ක් විය.

(ඇ) විසර්ජන ගිණුම

මුළු ප්‍රතිපාදනය හා වියදම

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 6,586,379,500 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. 6,337,648,300 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ ශුද්ධ ඉතිරිවීම් රු. 248,731,200 ක් හෙවත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 3.78 ක් විය. විස්තර පහත දැක්වේ.

| වියදම් වර්ගය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු. | ශුද්ධ ප්‍රතිපාදනය රු. | වියදම රු. | ඉතිරිය රු. | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| පුනරාවර්තන | 5,517,095,000 | 5,616,903,500 | 5,598,757,134 | 18,146,366 | 0.32% |
| මූලධන | 956,279,000 | 969,476,000 | 738,891,166 | 230,584,834 | 23.78% |
| **එකතුව** | **6,473,374,000** | **6,586,379,500** | **6,337,648,300** | **248,731,200** | **3.78%** |

(ඇ) <u>අය වැය විචලනය</u>

වැය විෂයන් 15 ක් යටතේ ප්‍රතිපාදනය කර තිබුණු එකතුව රු. **26,601,550** ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි

(ඉ) <u>අග්‍රිම ගිණුම්</u>

2010 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය වෙත රු. 1,736,692,792 ක්වූ අග්‍රිම හර ශේෂ තිබුණු අතර ඒ පිළිබඳ කාල විශ්ලේෂණයක් පහත දැක්වේ.

| වර්ෂ 1 ට අඩු | වර්ෂ1 ට වැඩි 2 ට අඩු | වර්ෂ2 ට වැඩි | 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|---|
| හර | හර | හර | හර |
| රු. | රු. | රු. | රු. |
| 1,143,461,778 | 213,398,821 | 379,832,193 | 1,736,692,792 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වර්ෂ දෙකට වැඩි ශේෂයන් තුල 2008 සහ ඊට පෙර වර්ෂ වලට අදාල නොපියවූ අග්‍රිම ශේෂ දැක්වේ. ඉදිකිරීම් වැනි අත්‍යවශ්‍ය කටයුතු සඳහා දෙනලද රු. 470,181,889 ක මුදලක් ද ඊට ඇතුලත්ය.

(ii) වසර 01 ට අඩු ශේෂය යටතේ සමාලෝචිත වර්ෂය තුල මෙම අමාත්‍යාංශය යටතේ වෙනම ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වූ විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යාංශයට අයත් රු. 4,137,230 ක් වූ නොපිය වූ අත්තිකාරම් දැක්වේ.

(iii)2011 අප්‍රේල් 30 දින වන විටද පියවා නොතිබුණු ශේෂවල එකතුව රු. 1,630,139,722 ක් විය. 2011 ජුනි 30 දින වන විට මෙම ශේෂය රු.1,038,436,281 දක්වා තව දුරටත් අඩුකර ගැනීමට හැකිවී ඇති බව ලේකම්වරයා දන්වා ඇත.

(iv)1996 අප්‍රේල් 20 දිනැති මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක එම්එෆ්6/1/1/96 හි 2.4.1 ජේදය ප්‍රකාරව, නිලධාරියා දිවයිනට ආපසු පැමිණ දින 30 ක් ඇතුලත විදේශ ගමන් වියදම් අත්තිකාරම් නිරවුල් කර ගිණුම්ගත කල යුතු වුවත්, අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යාලයේ හා දූත මණ්ඩලයන්හි 2011 අප්‍රේල් 30 දිනට එසේ නිරවුල් නොකල ගමන් වියදම් අත්තිකාරම් ශේෂයන් පිළිවෙලින් රු. 24,630,396 ක් හා රු. 8,208,723 ක් විය.

(v) මු.රෙ.371(2) ප්‍රකාරව තත්කාර්ය අතුරු අග්‍රිමයන් එය දෙන ලද කාර්යය නිම කළ විගස පියවිය යුතු වුවද, 2010 දෙසැම්බර් 31 දින වනවිට එකතුව රු. 312,620,141 ක් වූ අත්තිකාරම් ශේෂයන් නිරවුල් කිරීමකින් තොරව පැවතුණු අතර එයින් රු. මිලියන 85.4 ක් ඉදිකිරීම වෙනුවෙන් ගෙවන ලද අත්තිකාරමක් බව ලේකම්වරයා දන්වා ඇත.

(ඊ) <u>පොදු තැන්පත් ගණුම</u>

2010 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුම් පහක ශේෂයන්හි එකතුව 735,614,348 ක් වූ අතර, අංක 15/25/01 දරන අමාත්‍යාංශයේ පොදු තැන්පත් ගිණුම හැර අනෙකුත් පොදු තැන්පත් ගිණුම් වල ශේෂයන් සම්බන්ධයෙන් කාල විශ්ලේෂණයක් ඉදිරිපත් නොකරන ලදි. පහත සඳහන් නිරීක්ෂණයන්ද කරනු ලැබේ.

(i) අංක 15/25/01 දරන අමාත්‍යාංශයේ පොදු තැන්පත් ගිණුම හැර අනෙකුත් පොදු තැන්පත් ගිණුම් වල ශේෂයන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් මුදල් රෙගුලාසි 571 හි විධිවිධාන පරිදි අර්ධ වාර්ෂිකව කේවල ශේෂ ලැයිස්තු පිළියෙල කර නොතිබුණි.

(ii) විගණනය වෙත ලබා දුන් තොරතුරු වලට අනුව, ඉහත ශේෂය තුල මුදල් රෙගුලාසි 571 (2) හි විධිවිධාන පරිදි කටයුතු කල හැකිව තිබුණු නමුත් එසේ කටයුතු නොකල වර්ෂ දෙකකට වැඩි කාල සීමාවක් පැවති තැන්පත් ශේෂ වල එකතුව රු. 123,772,400 ක් විය.

(උ) <u>රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම</u>

(i) <u>සීමා පිළිනොපැදීම</u>

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කළයුතු අංක 11201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම 2011ජුනි 24 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. පාර්ලිමේන්තුව විසින් පනවා තිබූ පහත සීමාවන් පිළිපැද නොතිබුණි.

| විෂය අංකය | අවම ලැබීම් සීමාව<br>රු. | සත්‍ය<br>රු. |
|---|---|---|
| 11201 | 29,600,000 | 22,085,013 |

(ii) <u>හඟ ණය ශේෂ</u>

විෂය අංක 11201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2010 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශ ප්‍රකාර අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 2,056,866 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්වයක පැවතුණි.

1.4 <u>වත්කම් කළමනාකරණය</u>

(අ) <u>නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්.</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අමාත්‍යාංශයේ ආර්ථික සම්බන්ධතා අංශයේ පැවතුනු භාවිතා කල හැකි තත්වයේ පවතින පරිගණක මුද්‍රණ යන්ත්‍ර දෙකක් 2011 ජුලි 01 දින ගබඩා අංශයට මාරු කරනු ලදුව තවදුරටත් භාවිතයෙන් තොරව පැවතුනි.

(ii) මැලේසියාවේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සඳහා 1996 වර්ෂයේදී මිලට ගත් ඉඩමක් වසර 14 ක් තිස්සේ අදාල කාර්යය සඳහා යොදවා ගැනීමකින් තොරව නිශ්කාර්යව පැවතුණ.

(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

ඉදිරිපත් කරන ලද සමීක්ෂණ මණ්ඩල වාර්තාවලට අනුව පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) අමාත්‍යාංශයේ ප්‍රවාහන ඇණියට අයත් වාහන 70 න් භෞතිකව සමීක්ෂණය කර තිබුනේ වාහන 11 ක් පමණි.

(ii) එක් අංශයකට අදාල කාර්යාල උපකරණ අයිතමයන් 07 ක් ඉන්වෙන්ට්‍රි ගතකර නොතිබු බැවින් අතිරික්තතා ඇතිව තිබූ බව අනාවරණය විය.

(ඇ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම

විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අංශය සතු භාවිතා කල හැකි තත්වයේ පවතින ජායා පිටපත් යන්ත්‍රයක්, එම අංශය විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ඉවත්ව නව අමාත්‍යාංශයක් ලෙස ස්ථාපිත වීමෙන් පසුවද තවදුරටත් විදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම් කාර්යාලයේ දක්නට ලැබුණි.

(ඈ) වත්කම් අපහරණය.

2009 නොවැම්බර් 15 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 438 ප්‍රකාරව රාජ්‍ය ආයතනයන්හි භාණ්ඩ හා වත්කම් නියමිත පරිදි අපහරණය කල යුතු වුවද, අමාත්‍යාංශයේ විදෙශ දූත මණ්ඩල කාර්යාල 18 කට අදාල භාණඩ සමීක්ෂණ මගින් 2010 වසර දක්වා වසර තුනක් තිස්සේ එලෙස අපහරණය කල යුතු ලෙස හදුනාගෙන ඇති භාණ්ඩ 355 ක් හා ප්‍රධාන කාර්යාලයේ අංශ 07 කට අදාලව වර්ෂයකට වැඩි කාලයක් තිස්සේ භාවිතයෙන් ඉවත් කර ඇති ජායා පිටපත් යන්ත්‍ර 01 ක් හා පරිගණක උපාංග 24 එලෙස අපහරණය කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඉ) ලැබිය යුතු ශේෂ

විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල කාර්යාලයන්හි නිලධාරීන් සඳහා කුලී පදනම මත ලබාගත්, පදිංචිය අත්හැර දමන ලද නිවාස 72 ක් සඳහා ගෙවන ලද රු. 10,881,629 ක් වූ ආරක්ෂිත තැන්පත් මුදල ආපසු අයකර ගෙන නොතිබුණි. මෙම තැන්පතු අතරේ නිවාස 35 කට අදාල එකතුව රු. 1,932,969 ක් වූ තැනපතු වසර 10 ට වඩා පැරණි ඒවා වූ අතර, නිවාස 34 ක් සඳහා තබන ලද රු. 2,772,322 ක් වූ තැන්පතු ලන්ඩන් මහ කොමසාරිස් කාර්යාලය හා සම්බන්ධ නිවාස වෙනුවෙන් විය. ඇප තැන්පත අයකර ගැනීමේ දීර්ඝ කාලන ප්‍රමාදය අග්‍රිම ගිණුම් නිරවුල් කිරීම කෙරෙහිද අහිතකර ලෙස බලපා තිබුණි.

1.5 අනුකූල නොවීම්

(අ) නීති,රීති,රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නයැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වු නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති,රෙගුලාසි යනාදියට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (i) | 2009 /03/24 දිනැති අංක 13/2008/11 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | 186,300 | නිළ වාහන හිමිකම් ඇති නිලධාරීන්ට මාසික ඉන්ධන දීමනාවක් වශයෙන් ගෙවිය යුතු වුවත්, එසේ උමනාව ලබා ගන්නා ඇතැම් නිලධාරීන් ලේකම්වරයාගේ අනුමැතියකින් තොරව ඇණවුම් මතද ඉන්ධන ලබාගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය තුලදී එපරිදි වෙන්කළ වාහන 10 ක් වෙනුවෙන් ලබා දී තිබූ ඉන්ධන ලිටර් 1620 ක් වෙනුවෙන් වැයකර තිබූ මුදල රු186,300 කි. |
| (ii) | 2004 පෙබරවාරි 24 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 01/2004 හි 3:2 ඡේදය | | සමාලෝචිත වර්ෂය සඳහා වූ කාර්ය සාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුලත පාර්ලිමේන්තුවේ සභා ගත කර නොතිබුණි. |
| (iii) | 2004 අගෝස්තු 31 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 353(5) 2 ඡේදය | | වාහන කුලී පදනම මත ලබා ගැනීමේ දී ගෙවිය හැකි උපරිම මාසික කුලිය රු. 40,000 ක් වුවත්, සමාලෝචිත වර්ෂය තුල එම සීමාව ඉක්මවා අවස්ථා 53 කදී වාහන 23 ක් කුලියට ලබාගෙන ගෙවීම් කර තිබුණි. |
| (iv) | 1982 පෙබරවාරි 02 දිනැති අමාත්‍යාංශ උපදෙස් මාලා අංක 82 හි 2 වන වගන්තිය | 125,077 | මියන්මාර්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ එක් නිලධාරියෙක් වැයවීම් පිළිබඳ විසතර ඉදිරිපත් කිරීමකින් තොරව රු.125,077 ක්වූ නියෝජන දීමනා ලබාගෙන තිබුණි. |
| (v) | අමාත්‍යාංශ උපදෙස් මාලා අංක 166 | 131,043 | මියන්මාර්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ හිටපු තානාපති වරයෙකු අනුමත වෛද්‍ය නිවාඩු මත ශ්‍රී ලංකාවට පැමිණිමේදී අමාත්‍යාංශ උපදෙස් මාලාවට පටහැනිව අදාල ගුවන් ගාස්තුව වන රු. 131,043 ක මුදල රජයේ අරමුදලින් ලබා ගෙන තිබුණි. |
| (vi) | විදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ අංක එෆ /ඩීඑම් /1/28 හා 2004/04/07 දිනැති අමාත්‍යාංශ උපදෙස් මාලා අංක 165 චක්‍රලේඛය | | වසර දෙකක් වූ සේවා පැවරුම් කාලය සම්පූර්ණ නොකර සේවය අතහැර පැමිණි මියන්මාර් තානාපති කාර්යාලයේ හිටපු තානාපතිවරයාට තීරු බදු රහිතව වාහනයක් ආනයනය කිරීමේ අනුග්‍රහය ප්‍රධානය කර තිබුණි. |

| | | |
|---|---|---|
| (vii) | අමාත්‍යාංශයේ 1999/අංක 01 දරන ගිණුම් උපදේශ චක්‍රලේඛයේ 3 (සී) වගන්තිය | කුවේට් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ 2009 වර්ෂය තුල සේවා වනිතා ඒකකය යොදා ගනිමින් ශ්‍රී ලංකා දිනය සැමරීම වෙනුවෙන් වූ උත්සවයට මුදල් රැස්කිරීම් වලට අදාලව මුදල් රෙගුලාසි 168 ප්‍රකාරව පොදු 172 කුවිතාන්සි වලින් බැහැරව අනුක්‍රමික අංක පාලනයක් රහිතව තානාපති කාර්යාලයේ නිල මුද්‍රාව යොදා නිකුත් කල වෙනත් ලදුපත් භාවිතා කර තිබුණි. එලෙස ලැබෙන මුදල් නිල බැංකු ගිණුමට බැර කිරීමක් හෝ අදාල සටහන් තානාපති කාර්යාලයේ නිල මුදල් පොතේ සටහන් කිරීමක් හෝ සිදුව් නොතිබුණි. |
| (viii) | අමාත්‍යාංශ චක්‍රලේඛ අංක x 333 y 175,640 හි 14 වන වගන්තිය | විදේශ දූත මණ්ඩල සේවය අවසන් කර පැමිණෙන නිලධාරීන් හට රැගෙන ආ හැකි ගමන් මලුවල බර සීමාවන් ඉක්මවා ඇති අවස්ථාවලදි චක්‍රලේඛ ප්‍රකාරව මුළු වියදමින් නිලධාරීන් ගෙවිය යුතු අනුපාතික ප්‍රමාණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුලදී කරනු ලැබූ නියදි පරීක්ෂණයේදී නිළධාරීන් අට දෙනෙකුගෙන් එපරිදි අයකරගෙන නොතිබූ අනුපාතික ප්‍රමාණයෙහි වටිනාකම රු. 175,640 ක් විය. |

## 1.6 කාර්ය සාධනය

2010 වාර්ෂික ඇස්තමේන්තු අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්

2010 අප්‍රේල් 30 දිනැති අංක 1651/20 දරණ අති විශේෂ ගැසට් නිවේදනය අනුව මෙම අමාත්‍යාංශය යටතට පැවරුණු විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යාංශය වෙනුවෙන් 2010 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවෙහි, සංවර්ධන කටයුතු සඳහා වූ වැඩ සටහන යටතේ ප්‍රාග්ධන වැය විෂයන් 13 කට වෙන් කරන ලද එකතුව රු. 25,016,550 ක් වූ ප්‍රතිපාදන වලින් කිසිදු මුදලක් වැයකර නොතිබුණි. එසේම එම වැඩ සටහන යටතේම විදේශ පුහුණු මධ්‍යස්ථාන පිහිටුවීම වෙනුවෙන් වෙන් කරන ලද රු. 15,000,000 ක ප්‍රතිපාදන මු.රෙ. 66 මගින් අමාත්‍යාංශයේ වෙනත් කාර්යයන් සඳහා මාරුකර තිබුණි. මෙලෙස විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධනය සඳහා වූ ප්‍රාග්ධන ප්‍රතිපාදනයන්ගේ ඌණ උපයෝජනය එම අංශය විසින් ඉටුකිරීමට සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් වල කාර්යය සාධනයේ දුර්වලතාවය පිළිඹිබු කරය. මේ සම්බන්ධයෙන් ලේකම්වරයා පහත පරිදි අදහස් දක්වා ඇත.

"මේ යටතේ වූ මූලධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාවරයෙකු නොසිටි බැවින්ද, මෙම අමාත්‍යාංශය විදේශ කටයුතු අමාත්‍යාංශයට අන්තර්ග්‍රහනය කිරීමට පෙර ස්ථාපිත කර තිබූ ලෝක වෙළඳ මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ කාර්යාලය සඳහා මිලදී ගැනීමේ අපේක්ෂාවෙන් ඇස්තමේන්තුවේ ඇතුලත් කර තිබූ ප්‍රාග්ධන වැය විෂයන් සඳහා වියදම් දැරීමට සිදු නොවූ බැවින්ද ප්‍රතිපාදන සියල්ල ඉතිරිව ඇත"

1.7. බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

(අ) ගැලපුම් කළයුතු ශේෂ

2010 දෙසැම්බර් මාසය සඳහා පිළියෙළ කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශ 27 ක දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයකට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| ගැලපුම් පිළිබඳ විස්තර | මාස 06-12 | අවුරුදු 1-3 | අවුරුදු 3 ට වැඩි | එකතුව |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| උපලබ්ධි නොවූ තැන්පතු | 2,664,172 | 62,457 | 154,095 | 2,880,724 |
| නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් | 39,716,146 | 780,027 | 311,555 | 40,807,728 |
| හඳුනා නොගත් හර | 142,759 | 873,313 | ---- | 1,016,072 |
| හඳුනා නොගත් බැර | 1,981,546 | 338,135 | ---- | 2,319,681 |
| වෙනත් ගැලපීම් | 355,206 | 4,248,413 | ---- | 4,603,619 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල තුනකට අදාල බැංකු සැසඳුම් ප්‍රකාශනයන්හි හඳුනා නොගත් වෙනස්කම්හි එකතුව රු. 4,603,619 ක් විය.

1.8. මතභේදයට තුඩුදුන් ගනුදෙනු

අමාත්‍යාංශය විසින් කර ඇති සමහරක් ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණ වලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) අමාත්‍යාංශය විසින් ඉන්දියානු සාගර සමුද්‍රීය කටයුතු සහයෝගිතා ආයතනය වෙත 2010 වර්ෂය තුලදී ද රු. 2,542,124 ක මුදලක් මුදා හැර තිබුණද, මෙම ආයතනයේ කටයුතු අධීක්ෂණය සඳහා වගකිවයුතු අංශයක් හෝ නිලධාරියෙක් වෙත වගකීම පවරා නොතිබුණි. ඒ හේතුවෙන් මෙම ආයතනයේ කටයුතු ප්‍රගති සමාලෝචනයට ලක් කිරීමක් ද කර නොතිබුණි.

(ආ) 2010 අප්‍රේල් 07 වන දින සිට ජුනි 30 දින දක්වා ජිනීවාහි පැවැත්වූ පාඨමාලාවකට සහභාගිවීම සඳහා විදේශගත වූ මියන්මාර් තානාපති කාර්යාලයේ උපදේශක වරියකට (counsellor) එම කාලය තුල ජීවන වියදම් දීමනා ආවරණය සඳහා ස්විස් පෑන්ක් 7,500 ක මුදලක් ලබා දීමට හැකි බව අදාල ප්‍රධානය කරනු ලැබූ ආයතනය විසින් දන්වා තිබියදී , එම නිලධාරිනිය විසින් ඒ පිළිබඳව අනාවරණය කර නොතිබුණු අතර, 2010 අප්‍රේල්, මැයි සහ ජුනි යන මාසයන් සඳහා විදේශ දීමනාව ලෙස ඇමරිකානු ඩොලර් 6,177 ක් (රු. 708,811) මුදලක් ගෙවා තිබුණි.

(ඇ) යාපනයේ පුස්තකාලයට පොත් මිලදී ගැනීම සඳහා 2010 වර්ෂය තුල විදේශ තානාපති කාර්යාල 04 කින් ලැබූ මුදල් වලින් රු. 124,435 ක් වටිනා පොත් මිලදී ගෙන තිබුණද, ඒවා නිසි ලෙස යාපනය පුස්තකාලයට ලැබුනේද යන්න අමාත්‍යාංශයේ ලේඛණ අනුව තහවුරු නොවිණි.

1.9. **අවිධිමත් ගණුදෙනු**

අමාත්‍යාංශය එළඹ තිබුණු සමහරක් ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) **ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලින් බැහැර වීම**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් විවිධ ආයතන වලින් වාහන කුලියට ලබා ගැනීම සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමට හා ගිවිසුම් අත්සන් කිරීමට ක්‍රියාකර නොතිබුණි.

(ආ) **වෙනත්**

(i) අමාත්‍යාංශයේ 2010 වර්ෂය තුලදි රු. 4,473,520 කට මිලට ගත් පරිගණක යන්ත්‍ර 40 ක් ගබඩාවට ලැබීමේදි ඉල්ලුම් කරන ලද පිරිවිතරයන්ගෙන් යුක්තව අදාල භාණ්ඩ සපයා ඇද්දැයි යන්න පිළිබඳව නිසි ඇගයීමක් හො තහවුරුවක් ලබා ගැනීමකින් තොරව ගෙවීම් කර තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුලදී පෞද්ගලික ආයතනයකින් වාහන කුලියට ලබා ගැනීම වෙනුවෙන් රු. 1,851,296 ක් ගෙවා තිබුණි. ඒ තුල වාහන ධාවනය පිළිබඳව කිසිදු තොරතුරක් නොමැතිව කරනු ලැබූ රු. 311,427 ක අතිරේක ගෙවීමක්ද, වාහන කුලියට දෙන ලද ආයතනයේ ඉල්ලීමකින් තොරව හා ධාවන සටහන්ද නොමැතිව 2009 වර්ෂය වෙනුවෙන් වාහන 4 කට අවස්ථා 15 වකදි ගෙවන ලද රු.1,107,121 ක් ද ඇතුලත් විය.

1.10. **පාඩු හා හානි**

නියැදි විගණන පරීක්ෂණ වලදී පහත පරිදි පාඩ හා හානි සිදුවූ අවස්ථා නිරීක්ෂණය විය.

(අ) එකතුව රු. 21,022,801 ක් වු පාඩු 20 ක් සම්බන්ධයෙන් මු. රෙ. 102,104 හා 109 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) මු.රෙ. 110 ප්‍රකාරව, හානි පිළිබඳ ලේඛනයක් සමාලෝචිත වර්ෂය තුලදි පවත්වාගෙන ගොස් තිබුණද එහි සටහන් ඇතුලත් කර යාවත්කාලීන කර නොතිබුණි.

(ඇ) ඉතාලි තානාපති කාර්යාලයේ නිලධාරීන් 23 දෙනෙකු සඳහා අනුමැතියකින් තොරව ගෙවන ලද යුරෝ 28,739 ක් වු දිරිදීමනා ආපසු නැවත අයකර ගැනීමට පියවර ගන්නා ලෙස රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් නියොග කර තිබුනද, ස්ථානීය කාර්ය මණ්ඩලයේ 13 දෙනෙක්ගෙන් හා ස්ථානීය නොවන කාර්ය මණ්ඩලයේ එක් නිලධාරියෙක්ගෙන් අයවිය යුත මුදල් තවදුරටත් අයකර ගැනීමට අපහසු වී තබුණි. මේ හේතුවෙන් රජයට සිදුවිය හැකි සම්පූර්ණ අලාභය රු. 1,628 ,712 ක් විය.

1.11. **අනාර්ථික ගණුදෙනු**

අරපිරිමැස්මෙන් තොරව ආයතනයට වාසිදායක නොවන එළඹ තිබුණු ගණුදෙනුද, වු බව නියදි පරීක්ෂණ වලදි අනාවරණය වු අතර පහත අවස්ථා උදාහරණ වශයෙන් දැක්විය හැක.

(අ) 2004 අගෝස්තු 31 දිනැති රාජ්‍ය මුල්‍ය චක්‍රලේඛ 353 (5) ප්‍රකාරව අළුත්වැඩියා කිරීමට වැඩි වියදමක් දැරීමට සිදුවන අනාර්ථික වාහන අපහරණය කල යුතු වුවද, අමාත්‍යාංශය තුල වාර්ෂිකව නිරන්තරයෙන් අළුත්වැඩියා කිරීමට සිදුවන වාහන ඇති බව නියැදි පරීක්ෂණයන්ගෙන් අනාවරණය විය. මෙම තත්ත්වය මත සමාලෝචිත වර්ෂය තුල පමණක් මුල් ඇස්තමේන්තුව මගින් ව්‍යාපෘති තුනක් යටතේ වාහන අළුත්වැඩියා කටයුතු සඳහා වෙන් කරන ලද රු. 51,740,000 ක් වූ ප්‍රතිපාදන වලට අමතරව රු. 31,788,910 ක් වූ ප්‍රතිපාදන මු.රෙ 66 මාරු කිරීම් හා අතිරේක ප්‍රතිපාදන වලින් ලබාගෙන තිබුණි.

(ආ) මහනුවර පල්ලේ කැලේ පැවති 2010 වර්ෂය සඳහා වූ දැයට කිරුළ ප්‍රදර්ශණය වෙනුවෙන් ප්‍රදර්ශන කුටි සැකසීම හා සැලසුම් කිරීමේ කාර්යයන් සඳහා සැපයුම්කරුවෙකු තෝරාගැනීමේදී අමාත්‍යාංශය විසින් ප්‍රසම්පාදන පිලිවෙත් නිසි අයුරින් අනුගමනය කර නොතිබුණි. තවද කොන්ත්‍රාත්කරුගේ අවසන් ඉන්වොයිසිය නිරවුල් කිරීමේදී මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශයේ නිර්දේශය පරිදි රු. 5,000,000 සම්පූර්ණ ගෙවීමක් සහ ඊට අදාල බදු මුදල් ගෙවා තිබියදී, නැවතත් ප්‍රසම්පාදන කමිටුවේ තීරණය පරිදි තවත් රු. 2,922,663 ක මුදලක් හේතු නොදක්වා ගෙවා තිබුණි. මෙම අතිරේක ගෙවීම් 2011 වර්ෂයේ දැයට කිරුළ සඳහා දරන ලද වියදම් හා සැසඳීමේදී අනාර්ථික බව නිරීක්ෂණය විය.

(ඇ) විදේශ දූත මණ්ඩල සේවය අවසන් කර නැවත ශ්‍රී ලංකාවට පැමිණෙන නිලධාරීන්ගේ ගමන් මලු වරායෙන් නිදහස් කර ගැනීමේදී නිරන්තරයෙන් විශාල ප්‍රමාදයන් පවතින අතර, ඒ හේතුවෙන් වරාය හා අනෙකුත් ගාස්තු ඉහල අගයක් ගෙන තිබුණි. නිලධාරියාගේ වරදින් ඇතිවන ප්‍රමාද ගාස්ත අමාත්‍යාංශ උපදෙස් මාලා X333Y හි 14 හා 15 ඡේදයන්හි විධිවිධාන ප්‍රකාරව නිලධාරියාගෙන් අයකර ගැනීමටත්, නිෂ්කාශණ නියෝජිතයාගේ ප්‍රමාදයන් මත ඇතිවන ප්‍රමාද ගාස්තු ඔහුට ගෙවීම් කිරීමේදී අඩු කර ගැනීමටත් ක්‍රියාකර නොතිබුණි. 2010 දෙසැම්බර් මාසය තුල අවස්ථා 04 කදී දින 53 ක් වෙනුවෙන් ප්‍රමාද ගාස්තු ලෙස රු. 82,895 ක් අමාත්‍යාංශය විසින් ගෙවා තිබූ බව කරන ලද නියදි පරීක්ෂාවේදී අනාවරණය විය.

## 1.12 මානව සම්පත් කළමනාකරණය

(අ) අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු

2010 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය | | | විදේශ දූත මණ්ඩලයන්හි කාර්ය මණ්ඩලය | | |
|---|---|---|---|---|---|---|---|
| | | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
| i | ජ්‍යෙෂ්ඨ මට්ටම | 93 | 73 | 20 | 162 | 136 | 26 |
| ii | තෘතක මට්ටම | 3 | 2 | 1 | - | - | - |
| iii | ද්විතීක මට්ටම | 285 | 248 | 37 | 218 | 174 | 44 |
| iv | ප්‍රාථමික අංශය | 116 | 114 | 2 | 507 | 492 | 15 |
| v | වෙනත්(අනියම්,තාවකාලික,කොන්ත්‍රත් පදනම) | 6 | 5 | 1 | - | - | - |
| | එකතුව | 503 | 442 | 61 | 887 | 802 | 85 |

පහත සඳන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අමාත්‍යාංශයේ කාර්යභාර්ය හා වගකීම පිළිබඳ සැලකිලිමත්ව කාර්ය මණ්ඩලයේ අවශ්‍යතාව නැවත තීරණය කිරීම සඳහා ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභා කාර්යාලයේදී පවත්වන ලැබූ සාකච්ඡාවට අනුව ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල වල අනුමත සේවක සංඛ්‍යාව සම්බන්ධයෙන් අදාල අනුමැතිය මේ වන තෙක් ලැබී නොමැත.

(ii) මෑත අතීතයේදී දූත මණ්ඩල සඳහා අවශ්‍යවන්නාවූ ස්ථානීය සේවක සංඛ්‍යාව පිළිබඳ තක්සේරු කිරීමකින් තොරව දූත මණ්ඩල සඳහා පත් කිරීම් කර ඇති බවත්, එම තත්වය දූත මණ්ඩල සඳහා වෙන් කරන ලද අරමුදල් කළමණාකරණය කිරීමේදී දුෂ්කරතාවයක් මතු වීමට හේතු වී ඇති බවත් නිරීක්ෂණය විය.

1.13 <u>අභ්‍යන්තර පාලනය</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) <u>මුදල් බැංකු ගත කිරීම</u>

දෛනිකව එකතුවන මුදල් නිසි පරිදි ලේඛණ ගත කර හැකිතාක් ඉක්මනින් බැංකු ගත කල යුතු වුවද, ඇතැම් දූත මණ්ඩල විසින් එසේ එකතුවන මුදලින් වියදම් දරා තිබුන අතර, තවත් සමහර දූත මණ්ඩල විසින් එලෙස එකතුවන මුදල් ප්‍රමාද වී බැංකු ගතකර තිබුණි.

(ආ) <u>ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා මිලට ගැනීම</u>

අමාත්‍යාංශය ලිපද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා මිලට ගැනීම සම්බන්ධව මු.රෙ. 715 -2 (ඌ) ප්‍රකාරව ඕනෑම අවස්ථාවක හරි වැරදි බැලීමට හැකිවන පරිද තොග ලේඛන යාවත්කාලීන කර නොතිබූ අවස්ථා දක්නට ලැබුනි.